# කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නීතිඥ සංගමය

# COLOMBO MAGISTRATE'S COURT LAWYERS' ASSOCIATION

CMCLA

2026.06.08

අතිගරු ජනාධිපතිතුමා,

ජනාධිපති ලේකම් කාර්යාලය,

ගාලු මුවදොර,

කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

**යෝජිත ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ගරු විනිසුරුතුමන්ලාගේ විශ්‍රාම යාමේ වයස සංශෝධනය කිරීම සම්බන්ධයෙනි.**

ඉහත කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා අප සංගමයේ විධායක කමිටුවේ යෝජනාව අනුව විශේෂ මහසභා රැස්වීමක් 2026.06.08 වන දින පැවති අතර, ඉහත මාතෘකා ගත කාරණය සම්බන්ධයෙන් එනම්, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ගරු විනිසුරුතුමන්ලාගේ විශ්‍රාම වයස වැඩිකිරීම සම්බන්ධයෙන් විරෝධය පළකිරීමේ යෝජනාවක් ඒකමතිකව සම්මත කරන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ගරු විනිසුරුතුමන්ලාගේ විශ්‍රාම ගැන්වීමේ වයස සංශෝධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් ගෙන ඒම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ස්ථාවරය ප්‍රසිද්ධියට පත් කර ඇති අතර, අප සංගමයද එම ස්ථාවරයම දරන අතර, මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය ගනු ලබන ඉදිරි පියවර සම්බන්ධයෙන් සහාය පළකිරීමට තීරණය කර ඇත්තෙමු.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය නිලධාරින් ලෙස යම් තනතුරකට පත්කරනු ලබන ඕනෑම නිලධාරියෙකු සිය ධූර කාලය අවසන් වීමෙන් පසුව ගෞරවනීය ලෙස එම තනතුරෙන් ඉවත් විය යුතුව ඇත. ක්‍රම විරෝධී සහ සදාචාර විරෝධී ලෙස යම් තනතුරක සේවා කාලය දීර්ඝ කිරීම ඍජු හෝ වක්‍ර අල්ලසක් ලෙස සැලකිය යුත්තේය.


| President | Vice Presidents | Secretary | Treasurer | Assistant Secretary | Assistant Treasurer |
|---|---|---|---|---|---|
| Guneratne Wanninayake | Mervyn N. De Silva 0779347793 | Chinthaka Fernando | Chandana Edirisinghe | Sampath Jayawardana 0758919078 | Eranga Karanayaka 0716046147 |
| | SanjeewaAnthony | | | | |
| 077755959 | 0773972042 | 077272998 | 0724524861 | | |

Chief Magistrate's Court, Hulftsdorp Street, Colombo 12, Sri Lanka.
Telephone: +94 777550959, +94 772729998


Scanned with CamScanner

කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නීතිඥ සංගමය

**COLOMBO MAGISTRATE'S COURT LAWYERS' ASSOCIATION**

අධිකරණ වෘත්තියේ ගෞරවය රැකෙන පරිදි දෛනික කටයුතු සිදුකර ගැනීම පමණක් නොව, පීඩාවකින් තොරව රාජකාරි කිරීමේ පරිසරයක් ද ගරු විනිසුරුතුමන්ලාටත්, නීතිඥවරුන්ටත්, අධිකරණ සේවකයින්ටත්, යුක්තිය සොයා පැමිණෙන පුරවැසියන්ටත් අහිමි වෙමින් පවතින බව අප නිරීක්ෂණය කර ඇත.

රජයේ වගකීම වන්නේ, නඩු කටයුතු වේගයෙන් අවසන් කිරීමට අවශ්‍ය පරිසරය ගොඩනැගීම සහ සේවා ස්ථානයේ තත්ත්වය උසස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමයි. රාජ්‍ය සේවයේ විශ්‍රාම ගැන්වීමේ වයස තීරණය විය යුත්තේ, ජාතික ප්‍රතිපත්තියක් මතය. පුද්ගල බද්ධව ආණ්ඩක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් මේ වන විට පැනනැගී නැත. ගරු විනිසුරුතුමන්ලා සෑම විටම ස්වාධීන පුද්ගලයින් විය යුතු අතරම දේශපාලනික හෝ වෙනත් සාධක මත මෙහෙයවනු ලබන පුද්ගලයන් නොවිය යුතුය. අධිකරණයේ ස්වාධීනත්වය, ගෞරවය ආරක්ෂා කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය ගනු ලබන ප්‍රගතිශීලි ක්‍රියාමාර්ගවලට අප සංගමයේ පූර්ණ සහය හිමිවන බව දැනුම් දීමට කැමැත්තෙමු.

මෙයට,

ලේකම්
නීතිඥ චින්තක ප්‍රනාන්දු

උප සභාපති
නීතිඥ සංජීව ඇන්තනි

පිටපත් :

1. සභාපති, ශ්‍රී ලංකා නීතිඥ සංගමය
2. අධිකරණ ඇමතිතුමා,


| President | Vice Presidents | Secretary | Treasurer | Assistant Secretary | Assistant Treasurer |
|---|---|---|---|---|---|
| Guneratne Wanninayake | Mervyn N. De Silva<br>0779347793<br>SanjeewaAnthony | Chinthaka Fernando | Chandana Edirisinghe | Sampath Jayawardana<br>0758919078 | Eranga Karanayaka<br>0716046147 |
| 077755959 | 0773972042 | 077272998 | 0724524861 | | |

Chief Magistrate's Court, Hulftsdorp Street, Colombo 12, Sri Lanka.
Telephone: +94 777550959, +94 772729998


Scanned with CamScanner